**සී/ස මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාරික (පුද්ගලික) සමාගම - 2018**

---

## 1.1 තත්ත්වාගණනය කළ මතය

සී/ස මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාරික (පුද්ගලික) සමාගමේ ("සමාගම") 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර සමාගමේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකැසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළයුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබාගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන්විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගත සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාල නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

## 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාරක ප්‍රාග්ධන වෙනස්වීම් යටතේ දැක්විය යුතු වර්ෂයේ වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු අගයන්හි වෙනස්වීම්වල බලපෑම මත මුදල් ගලා ඒමක් ලෙස දැක්විය යුතු රු. 2,938,675 ක් මුදල් ගලා යාමක් ලෙස දක්වා තිබුණි. | සංශෝධිත මුදල් ප්‍රවාහයේ නිවැරදි කර ඇත. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදි කිරීමට පියවර ගතයුතුය. |
| (ආ) වත්කම් මිලදී ගැනීමට අදාල රු. 343,140 ක මුදල් ගලා යාමක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් තුළ මුදල් ගලා ඒමක් ලෙස සටහන් කර තිබුණි. | සංශෝධිත මුදල් ප්‍රවාහයේ නිවැරදි කර ඇත. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදි කිරීමට පියවර ගතයුතුය. |

## 1.5.2 කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම

| අදාල ප්‍රමිතයට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවල 17:19 පරිච්ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පොත් අගය රු. 20,713,263 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇතත් | 2018 වර්ෂයේදී සම්පූර්ණයෙන් ක්ෂයවී ඇති වත්කම් නැවත 2019 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වමි. | ප්‍රමිතයේ ප්‍රතිපාදන ප්‍රකාරව වත්කම් ප්රත්‍යාගණනය කිරීමට කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇතිවූ ඇස්තමේන්තුගත දෝෂය ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිතවල 7.4 (d) පරිච්ඡේදය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් ගලා යාමක් ලෙස සැලකිය යුතු රු. 224,805 ක පාරිතෝෂික ගෙවීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි. | සංශෝධිත මුදල් ප්‍රවාහයේ නිවැරදි කර ඇත. | ප්‍රමිතය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමට පියවර ගතයුතුය. |
| (ඇ) | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිතියේ 5.5 පරිච්ඡේදය ප්‍රකාරව අවම වශයෙන් ආදායම හා මූල්‍ය පිරිවැය විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ මුහුණතෙහි ඉදිරිපත් කළයුතු වුවත්, ඒ වෙනුවට ආදායම හා පිරිවැය සටහනක් යටතේ ගණනය කර දළ ලාභය විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ මුහුණතෙහි දක්වා තිබුණි. | 2019 වර්ෂයේ ගිණුම්වලදී මූල්‍ය පිරිවැය විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ මුහුණතෙහි දැක්වීමට කටයුතු කරන බව දන්වමි. | ප්‍රමිතය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පියවර ගත යුතුය. |

**1.5.3 අවිනිශ්චිත ගිණුම**

| විෂයය | මුදල | අවිනිශ්චිත ලෙස තිබූ කාලය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| 2017 වර්ෂයේ සිට පැවත එන හඳුනා නොගත් අන්තර් ගොවිපල ණයගැති ශේෂ අවිනිශ්චිත ගිණුම නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු නොකර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි. | 14,117,550 | වසර 02 | මෙම අවිනිශ්චිත ගිණුම 2019 වර්ෂයේ අවසාන ගිණුම්වල නිරවුල් කරන බව දන්වා සිටිමි. | අවිනිශ්චිත ගිණුම නිරවුල් කිරීමට නොපමාව කටයුතු කළයුතුය. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂයය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | මහවැලි පශු සම්පත් සමාගමෙන් ලැබිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණ ශේෂය එම සමාගම විසින් පිළිගෙන නොතිබුණි. | 1,030,137 | වටිනාකම සනාථ කරගත හැකි සාක්ෂි | ඉදිරිපත් කර නොතිබුණි. | ශේෂ සනාථන විගණනයට සෘජුව ලබාගැනීමට අවශ්‍ය කටයුතු සැලැස්විය යුතුය. |
| (ආ) | <u>පොදු සංචිතය</u> | | | | |
| | මහවැලි ආර්ථික ඒජන්සිය | 403,962,731 | වටිනාකම සනාථ කරගත හැකි සාක්ෂි | මෙම වටිනාකම්වලට අදාල කිසිදු සාක්ෂියක් සමාගම සතුව නොමැත. | ශේෂ සනාථන විගණනයට සෘජුව ලබාගැනීමට අවශ්‍ය කටයුතු සැලැස්විය යුතුය. |
| | කොත්මලේ කිරි සංවර්ධන අරමුදල | 2,900,000 | | | |
| | යුරෝපා ආර්ථික කොමිසමේ ප්‍රාග්ධන ප්‍රදාන | 3,583,706 | ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම්ගත කිරීමට අදාල ලියවිලි | මෙම ශේෂය සඳහා ශේෂ සහතිකයක් නොමැත. 2012 වර්ෂයේ සිට මෙම ගෙවීම් නතර කර ඇත. එම නිසා මෙම ශේෂය ලියාහැරීමට 2019 වර්ෂයේදී කටයුතු කරන බව දන්වා සිටිමි. | ශේෂ සනාථන විගණනයට සෘජුව ලබාගැනීමට අවශ්‍ය කටයුතු සැලැස්විය යුතුය. |
| | විදේශ ආධාර | 5,729,782 | | | |

## 1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2010 වර්ෂයේදී වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය වෙත පවරා තිබුණු නිරාවිය ගොවිපල සතුව තිබුණු පශු සම්පත් තොගය වෙනුවෙන් ලැබිය යුතු රු. 5,820,430 ක් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටද අයකරගෙන නොතිබුණි. | මෙම ශේෂ නිරවුල් කරන ලෙස මෙම වර්ෂයේදී ඉල්ලීම් කළද, එය සිදුනොවූ අතර, 2019 වර්ෂයේ දී නිරවුල් කරගැනීමට කටයුතු කරන බව දන්වමි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට නොපමාව කටයුතු කළයුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2015 වර්ෂයේදී සිදුකළ වැටුප් සංශෝධනයට අනුව සේවකයින්ට ගෙවිය යුතු රු. 6,893,711 ක හිඟ වැටුප් සහ ඊට අදාල රු. 1,817,553 ක සේවක අර්ථසාධක හා සේවක භාරකාර අරමුදල් දායකත්වය සඳහා වෙන් කිරීම් සිදුකර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වනවිටද ඒවා ගෙවා නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී ගෙවීම් කටයුතු සිදුකිරීමට අවශ්‍ය පියවර ගන්නා බව දන්වා සිටිමි. | ගෙවිය යුතු ශේෂ ගෙවීමට නොපමාව පියවර ගතයුතුය. |
| (ආ) | 2013 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු රු. 12,015,025 ක දායක මුදලක් නොගෙවා තිබීම නිසා ඉදිරියේදී සමාගමට අධිභාර ගෙවීමට සිදුවිය හැකි බව නිරීක්ෂණය විය. | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු.මිලියන 5.8 ක මුදල ලබාගෙන අර්ථසාධක අරමුදල් ගෙවීමටත්, ඉතිරිය රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාරය ආරම්භ වූ පසු ගෙවා අවසන් කිරීමටත් කටයුතු කරන බව දන්වමි. | ගෙවිය යුතු ශේෂ ගෙවීමට නොපමාව පියවර ගතයුතුය. |

## 02. මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 4,428,901 ක පාඩුවක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ පාඩුව රු. 4,421,557 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 7,344 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සමාගමේ ව්‍යාපාර කටයුතු ප්‍රතිසංවිධානය නොකිරීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 03. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දැනට පාඩු ලබමින් පවත්වාගෙන යනු ලබන මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාරික (පුද්) සමාගම රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාරයක් ලෙස ප්‍රතිසංවිධානය කිරීම සඳහා පෞද්ගලික ආයෝජකයකු සම්බන්ධ කර ගැනීම සඳහා 2016 ජනවාරි 28 දිනැති අමප/16/0063/704/003 දරන අමාත්‍ය මණ්ඩල තීරණයෙන් අනුමැතිය ලබාදී තිබුණු අතර, 2018 ඔක්තෝබර් 03 දිනැති අමප/18/2083/803/031 මඟින් පෞද්ගලික සමාගමකට අනුමැතිය ලබාදී ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම්ට නියම කර තිබුණද, 2019 ජුලි 29 දින වනවිටත් එම තීරණ ක්‍රියාත්මක කර නොතිබුණි. | රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාරයක් ලෙස ප්‍රතිසංවිධානය කිරීම අත්‍යාවශ්‍යවී ඇති බව දන්වා සිටිමි. | අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීමට හෝ එසේ නොකරන්නේ නම්, අමාත්‍ය මණ්ඩල තීරණ සංශෝධනය කර ගැනීමට කටයුතු කළයුතුය. |
| (ආ) | සමාගමේ සාංගමික සංස්ථා පත්‍රය අනුව අනුදත් ප්‍රාග්ධනය රු. 10 කොටස් 5,000,000 කින් සමන්විතවී තිබුණු අතර, ප්‍රාරම්භක අධ්‍යක්ෂවරුන් වෙත කොටස් 03 ක් පමණක් නිකුත් කර තිබුණද, අනෙකුත් කොටස් 2018 දෙසැම්බර් 31 දින දක්වාම නිකුත් කර නොතිබුණි. නිකුත් කර තිබූ කොටස් 03 ම වෙනත් පුද්ගලික සමාගමක අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු වෙත ලබාදී තිබුණු අතර, මහවැලි අධිකාරියේ හිමිකාරීත්වය සඳහා සමාගමේ කිසිදු කොටසක් ලබාදී නොතිබුණි. | සමාගම නමින් නිකුත් කර ඇති කොටස් 03 නැවත ආපසු පවරාගෙන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත නිකුත් කිරීමට 2019 වර්ෂයේදී කටයුතු සිදුකරමින් පවතින බව දන්වා සිටිමි. | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත කොටස් නිකුත් කිරීමට කටයුතු කළයුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගමේ සාංගමික සංස්ථා පත්‍රයේ මූලික අරමුණු 12 ක් දක්වා තිබුණද, සමාගමේ ගොවිපලවල වගා කටයුතු සිදුකිරීම, තොග සහ සිල්ලර වශයෙන් කුකුල් පාලනය සිදුකිරීම, ගොවීන්ට කුකුල් පාලනය සඳහා අවශ්‍ය කෑම නිෂ්පාදනය, ගව | මෙම අරමුණු ඉටුකර ගැනීම සඳහා රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාරයක් ආරම්භ කිරීමට කටයුතු යොදා | සාංගමික සංස්ථා පත්‍රයේ දක්වා ඇති අරමුණු ඉටුකර ගැනීම |

| | | | |
|---|---|---|---|
| | ඌරන් කුකුලන් ආදී සතුන් බෝ කිරීම, විකිණීම, වැඩිදියුණු කිරීම, සැකසීම හා අපනයන කටයුතු හා පලතුරු, ධාන්‍ය වර්ග ආශ්‍රිත ව්‍යාපාරික කටයුතු සිදුකිරීම යන අරමුණු ඉටුකර නොතිබුණු අතර, මීගව, එළගව, කුකුල්, ඌරන් හා එළු පාලනය සුළු වශයෙන් සහ කිරි ආශ්‍රිත නිෂ්පාදන සිදුකිරීමේ කටයුතු පමණක් සිදුකරමින් පැවතුණි. | ඇත. එම ක්‍රියාවලිය අවසන්වූ පසු මෙම අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. | සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට පශු සම්පත් අංශය යටතේ ක්‍රියාත්මක කර තිබුණු ක්‍රියාකාරකම් යටතේ ඉලක්කගත නිෂ්පාදනය තත්‍ය නිෂ්පාදනය සමඟ සැසඳීමේදී බොයිලර් කුකුල් මස් නිෂ්පාදනය සියයට 27 ක් ද, ඌරු මස් නිෂ්පාදනය සියයට 16 ක් ද, එළුවන් ඇති කිරීම සියයට 11 ක් ද, වශයෙන් අඩු අගයක් ගෙන තිබුණි. | -එම- | ඉලක්කගත නිෂ්පාදනය ලඟාකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ඇ) | සමාගම විසින් දැනට භාවිතා කරනු ලබන ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් රු. 3,162,812 ක් වූ වාහන 04 ක් සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද, එම වාහන පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද සමාගමේ ප්‍රධාන කාර්යාලය පිහිටි මහවැලි අධිකාරියට අයත් දෙමටගොඩ ප්‍රදේශයේ පිහිටි ඉඩම සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් යටතේ රු. 14,929,159 ක් ලෙස දක්වා තිබුණද, එම ඉඩම පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී පවරා ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | භාවිතා කරනු ලබන වාහනවල අයිතිය සමාගමට පවරා ගැනීමට කටයුතු කළයුතුය. |
| (ඈ) | ගිරාඳුරුකෝට්ටේ ගොවිපල තුළ පිහිටා තිබුණු කිරි සැකසුම්හල ආරම්භ කරන ලද 1986 වර්ෂයේ සිට භාවිතා කරන ලද යන්ත්‍ර සූත්‍ර මඟින් කිරි නිෂ්පාදන කටයුතු සිදුකරමින් තිබුණි. කර්මාන්තශාලා ගොඩනැගිලි පැරණිවීම හේතුවෙන් පරිශ්‍රයේ බිම ටයිල් කැඩී ගොස් තිබීම, වහලය අබලන්වීම හා වැසි ජලය කර්මාන්තශාලා තුළට පැමිණීම, කානු පද්ධතිය අබලන්වීම, අභ්‍යන්තර පිරිසිදු කිරීමේ පද්ධතිය දුර්වලව පැවතීම ආදී කරුණු නිසා සෞඛ්‍යාරක්ෂිත ගැටළු පැන නැඟී තිබුණි. මෙවැනි දුර්වල පරිසර තත්ත්වයන් මත නිෂ්පාදන කාර්යයන් සිදුකිරීම නිසා ඉදිරියේදී නීතිමය ගැටළු පැනනැගීමට හැකි බව නිරීක්ෂණය විය. | මෙම ගැටළු නිරාකරණය කර ගැනීමට රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාර ආරම්භ කිරීම සැලසුම් කර ඇත. | නිෂ්පාදනයේදී සෞඛ්‍ය ආරක්ෂිත ගැටළු ඇතිවීමට තුඩුදෙන හේතූන් නිවැරදි කිරීමට පියවර ගතයුතුය. |
| (ඉ) | 2018 දෙසැම්බර් 31 දින වනවිට සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් යටතේ දක්වා තිබුණු ගොවිපලවල් 05 කට අයත් රු. 21,359,381 ක් වටිනාකමැති වත්කම් සමාගම විසින් ලිඛිත | මෙම ගොවිපලවල් 05 ට අදාල වත්කම් වටිනාකම 2019 වර්ෂයේදී ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත | ලිඛිත අනුමැතියකින් තොරව වත්කම් |

| | | | |
|---|---|---|---|
| | අනුමැතියකින් තොරව අවිධිමත් ලෙස මහවැලි අධිකාරිය වෙත පවරා තිබුණි. | මාරු කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | පැවරීම නොකළ යුතුය. |
| (ඊ) | සමාගම සතු ගිරාදුරුකෝට්ටේ ගොවිපල සත්ව පාලන පුහුණු මධ්‍යස්ථානයක් බවට පරිවර්තනය කිරීමේ අරමුණින් මහවැලි අධිකාරියේ "සී" කලාපය විසින් 2014 සහ 2015 වර්ෂවලදී රු. 12,501,900 ක් වැයකර ඉදිකරන ලද ගවගාල්, එළුගාල් ඇතුළු ඉදිකිරීම් හා භාණ්ඩ රු. 8,967,600 කට අගය කර 2016 පෙබරවාරි 08 දින මෙම සමාගමට පවරාදී තිබුණි. වෙනත් පාර්ශවයන් විසින් ඔවුන්ගේ අරමුණක් ඉටුකර ගැනීම සඳහා සකස් කර තිබුණු මෙම ඉදිකිරීම් සමාගමට පවරාදී තිබුණද, මෙම ඉදිකිරීම් ප්‍රයෝජනයට ගැනීම සඳහා නිශ්චිත සැලසුමක් හෝ ක්‍රමවේදයක් සමාගම සතු නොවූ බැවින්, පවරා දුන් දිනයේ සිට එම වත්කම් නිෂ්කාර්යව පැවතුණි. | මෙම ගවගාල හා පැටවු ගාලත්, එළු ගාලත් පරිහරණයට ගැනීම සඳහා සතුන් මිලදී ගැනීමට හැකියාවක් සමාගම සතුව නොමැත. එම නිසා මෙම ගාල් රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාරය ආරම්භ කළ පසු ඵලදායී කාර්යයකට යොදාගන්නා බව දන්වමි. | මෙම ඉදිකිරීම් ප්‍රයෝජනයට ගැනීම සඳහා ක්‍රමවේද සකසා ගතයුතුය. |